

කාර්ය සාධන වාර්තාව

2012

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

අන්තර්ගතය

- අන්තර්ගතය 01
- හැඳින්වීම 02
- මෙහෙවර 03

01.ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 04

02.පාලන අංශයේ කාර්යසාධනය 05

03.කලාපීය භෞතික සැලසුම් අංශයේ කාර්යසාධනය 08

04.ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශයේ කාර්යසාධනය 11

05.ඉංජිනේරු අංශයේ කාර්යසාධනය 15

06.වාස්තු විද්‍යා අංශයේ කාර්යසාධනය 18

07.ගිණුම් අංශයේ කාර්යසාධනය 21

හැඳින්වීම

බ්‍රිතාන්‍ය පාලන සමයේදී අගනුවර වූ කොළඹ පිහිටි ජනාවාස ආශ්‍රිතව ඉදිකිරීම් සම්බන්ධයෙන් පැන නැඟුණු ගැටළු නිරාකරණය අරමුණු කරගෙන 1915 අංක 19 දරන නිවාස හා නගර වැඩි දියුණු කිරීමේ ආඥා පනත බලාත්මක විය. නමුත් වරාය හා දුම්රිය ආශ්‍රයෙන් ඇතිවූ නගරවල සංවර්ධනය සම්බන්ධයෙන් උක්ත පනතින් ආවරණය නොවූ ගැටළු ඇතිවිය. ඊට පිළියමක් ලෙස, 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ 1947 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. මේ යටතේ දිවයිනේ සියළු පළාත් ආයතන සම්බන්ධ කර ගනිමින් ජනාවාස සංවර්ධනය සඳහා සැලසුම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ආරම්භ විය.

නිසි සැලැස්මක් හා ඉදිරි දැක්මක් නොමැතිව රට තුළ ඇතිවූ සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස දුගී භාවය සම්පත් බෙදී යාමේ විෂමතාවය නිසා ප්‍රත්‍යන්ත ප්‍රදේශයන්හි සංවර්ධනයක් සිදු නොවීම, පරිපාලනය කොළඹ හා ප්‍රධාන නගර කීපයකට කේන්ද්‍රගතවීම, ජීවත්වීමට අවශ්‍ය මූලික පහසුකම් නොමැතිව විරැකියාවෙන් පෙළෙන සහනාධාර මතම ජීවත්වන බහුතර ජනතාවක් ව්‍යාප්ත වීම ආදී ගැටළු රාශියක් පැන නැගිනි. එබැවින් ආංශික සංවර්ධනයත් ප්‍රාදේශීය සංවර්ධනයත් අත්වැල් බැඳගත් තිරසාර සංවර්ධන ක්‍රියාවලියක අවශ්‍යතාවය දැඩි ලෙස දැනුනි.

ඊට පිළියමක් ලෙස ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මක් සකස් කරනු ලැබීම පිණිස 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ සංශෝධිත පනතින්, 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත සංශෝධනය කර, 2000 වර්ෂයේදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

ඒ අනුව ජාතික භෞතික සැලැස්ම, කලාපීය භෞතික සැලසුම් සහ ප්‍රාදේශීය භෞතික සැලසුම් සැකසීම, ක්‍රියාත්මක කිරීම හා යාවත්කාලීන කිරීමත්, පුජා භූමි සංවර්ධනය උදෙසා ව්‍යාපෘති සැලසුම් කිරීම හා වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය සැලසුම් සමග ඒ සඳහා වින්‍යාස සැලසුම් සැකසීමත් අතින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට වසර හැත්තෑවකට ආසන්න සේවා ඉතිහාසයක් ඇත.

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක විසි පහ ආවරණය කරමින් පළාත් නවයෙහිම පළාත් පාලන ආයතනවල සහයෝගය ඇතිව සීමිත ස්වභාවික සම්පත් සූක්ෂම ලෙස භාවිත කරමින්ද, ස්වාභාවික පරිසරය රැක ගනිමින්ද ස්වාභාවික විපත් අවම වන සුදුසු ස්ථානයන්හි අපරවාහ පහසුකම්වලින් යුතු නගර ස්ථාපිත කිරීම සඳහා නගර සැලසුම් කිරීම, ශ්‍රී ලංකාවට යෝග්‍ය නව නාගරික නිර්ණායකයන් හඳුනා ගැනීම, ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලි ලෙස උපයෝගී කර ගනිමින් ලංකාවට ගැලපෙන කර්මාන්ත උද්‍යාන ආකෘතියක් හඳුනා ගැනීම මගින් තිරසාර සංවර්ධනයට දායක වීම ආදී කර්තව්‍යන් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ සැලසුම්කරණයේ යෙදී සිටින ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ නගර සංවර්ධනයට ඉටු කළ සහ ඉටුකරමින් සිටින මෙහෙවර අති මහත්ය.

මෙම කර්තව්‍යන් ඉටු වන්නේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වන ජාතික භෞතික සැලසුම් අංශය, ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය, කලාපීය භෞතික සැලසුම් අංශය, පර්යේෂණ අංශය හා එම මෙහෙය සඳහා දායකත්වය සපයන පාලන අංශය, ගිණුම් අංශය, ඉංජිනේරු අංශය, වාස්තු විද්‍යාත්මක අංශය යන අංශවල සාමූහික කැපවීමෙනි. මෙම එක් එක් අංශවල 2012 වසරේ කාර්ය සාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු එක් එක් පරිච්ඡේද යටතේ දක්වා ඇත.

මෙහෙවර

“ ජාතික භෞතික ප්‍රතිපත්ති ,සැලසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික,සමාජයීය,භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව,පළාත් බද හා ප්‍රාදේශීය සැලසුම් මගින් එම ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම සහ පාලනය කිරීම”

1. *ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව - අනුමත කාර්ය මණ්ඩලය*

අනු අංකය	තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කාණ්ඩය	අනුමත තනතුරු සංඛ්‍යාව
1.	අධ්‍යක්ෂ ජනරාල්		විශේෂ	SL 3-2006	1
2.	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)	දෙපාර්තමේන්තුගත	විශේෂ	SL 3-2006	1
3.	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රියාත්මක කිරීම්)	දෙපාර්තමේන්තුගත	විශේෂ	SL 3-2006	1
4.	අධ්‍යක්ෂ (පාලන)	ශ්‍රී ලංකා පරිපාලන සේවය	1	SL 1-2006	1
5.	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	1	SL 1-2006	1
6.	අධ්‍යක්ෂ (ඉංජිනේරු)	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	1	SL 1-2006	1
7.	අධ්‍යක්ෂ (ක්‍රියාත්මක කිරීම්, ඇගයීම් හා සම්බන්ධීකරණ)	දෙපාර්තමේන්තුගත	1	SL 1-2006	1
8	අධ්‍යක්ෂ (පර්යේෂණ)	දෙපාර්තමේන්තුගත	1	SL 1-2006	1
9	අධ්‍යක්ෂ (කලාපීය භෞතික සැලසුම්)	දෙපාර්තමේන්තුගත	1	SL 1-2006	1
10	අධ්‍යක්ෂ (ප්‍රාදේශීය භෞතික සැලසුම්)	දෙපාර්තමේන්තුගත	1	SL 1-2006	1
11	අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)	ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය	1	SL 1-2006	1
12.	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (පාලන)	ශ්‍රී ලංකා පරිපාලන සේවය	111/11	SL 1-2006	1
13.	අභ්‍යන්තර විගණක	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	11	SL 1-2006	1
14	ගණකාධිකාරී	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	111/11	SL 1-2006	1
15.	සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු)	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	111/11	SL 1-2006	03
16.	සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (නගර නිර්මාණ)	දෙපාර්තමේන්තුගත	111/11	SL 1-2006	20
17.	සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය	111/11	SL 1-2006	2
18.	නීති නිලධාරී	දෙපාර්තමේන්තුගත		SL 1-2006	1
19.	පරිපාලන නිලධාරී	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (අධි පන්තිය)	අධි ශ්‍රේණිය	MN 7-2006 A	1
20	සැලසුම් කාර්යාල සහකාර	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (විශේෂ පන්තිය)		MN 7-2006 A	03
21.	ප්‍රධාන පරීක්ෂක	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය	විශේෂ	MN 7-2006	2

		(විශේෂ පන්තිය)		A	
22.	භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණික ශිල්පී	ශ්‍රී ලංකා සංනිවේදන හා තොරතුරු තාක්ෂණ සේවය	විශේෂ	MN 6-2006 A	6
23.	පද්ධති පරිපාලක	දෙපාර්තමේන්තුගත		MN 6-2006 A	1
24.	සංවර්ධන සහකාර	ආශ්‍රිත සේවා පුරප්පාඩු නොපිරවීම තුළින් තනතුරු අවසන් කිරීමට යටත්ව	2-11/1	MN 4-2006 A	22
25.	භෞතික සැලසුම් සහකාර (නගර නිර්මාණ)	ආශ්‍රිත සේවා දෙපාර්තමේන්තුගත		MN 4-2006 A	20
26.	භෞතික සැලසුම් සහකාර (වාස්තු විද්‍යාඥ)	ආශ්‍රිත සේවා දෙපාර්තමේන්තුගත		MN 4-2006 A	05
27.	භෞතික සැලසුම් සහකාර (ඉංජිනේරු)	දෙපාර්තමේන්තුගත (පුරප්පාඩු නොපිරවීම තුළින් තනතුරු අවසන් කිරීමට යටත්ව)		MN 4-2006 A	04
28	අයවැය සහකාර	ආශ්‍රිත සේවා		MN 4-2006 A	01
29.	සැලසුම් ශිල්පී	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය	111/11/1	MN 3-2006 A	27
30.	පරීක්ෂක	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය	111/11/1	MN 3-2006 A	9
31.	රාජ්‍ය කළමනාකරණ සහකාර	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	111/11/1	MN 2-2006 A	34
32.	පිළිගැනීමේ නිලධාරී	දෙපාර්තමේන්තුගත (දැනට තනතුර දරන නිලධාරියාට පෞද්ගලික වනසේ)	111/11/1	PL 1/2006 A	1
33.	සැලසුම් මුද්‍රණකරු	දෙපාර්තමේන්තුගත	111/11/1 විශේෂ	PL 1-2006 A	2
34.	මානක කම්කරු	දෙපාර්තමේන්තුගත	111/11/1 විශේෂ	PL 1-2006 A	3
35.	සැලසුම් භාරකරු	දෙපාර්තමේන්තුගත	111/11/1 විශේෂ	PL 1-2006 A	1
36.	සැලසුම් අළුත්වැඩියාකරු	දෙපාර්තමේන්තුගත	111/11/1	PL 1-2006 A	1
37	රියදුරු	රියදුරු සේවය	111/11/1 විශේෂ	PL 3-2006 A	14
38.	කාර්යාල කාර්ය සහායක	කාර්යාල සේවක සේවය	111/11/1	PL 1-2006	17

			විශේෂ	A	
37.	බංගලා භාරකරු	දෙපාර්තමේන්තුගත	111/11/1 විශේෂ	PL 1-2006 A	4
38.	මුරකරු	දෙපාර්තමේන්තුගත	111/11/1 විශේෂ	PL 1-2006 A	4

02. පාලන අංශයේ කාර්යසාධනය

දෙපාර්තමේන්තුවේ මෙහෙවර තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමවත්, ඵලදායීවත් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

එහි දී මානව හා භෞතික සම්පත් කළමනාකරණ කටයුතු, ආයතනික හා පරිපාලනමය කටයුතු සිදු කිරීමත්, ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමත්, දෙපාර්තමේන්තුවේ සියලු අංශයන් සඳහා සහාය සේවාවන් සැපයීමත්, පූජා භූමි කාර්ය මණ්ඩලයේ පාලනය පවත්වාගෙන යාමත් පාලන අංශයෙන් සිදු කරයි.

2.1 පාලන අංශයේ ප්‍රධාන අරමුණු වනුයේ,

- ❖ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුවේ අරමුණු ලඟාකර ගත හැකි වන පරිදි සංශෝධනය කිරීම.
- ❖ බඳවා ගැනීමේ පරිපාටි, උසස් කිරීමේ පරිපාටි සැකසීම, අනුමත කරවා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- ❖ කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය, සුභසාධනය, විනය පවත්වා ගැනීම ආදියයි.

2.2 දෛනික රාජකාරි ලෙස,

- ❖ දෛනික තැපෑල පිළිබඳ කටයුතු කිරීමත්
- ❖ අංශවල හා අංශ ගත සංබන්ධීකරණය පවත්වාගෙන යාමත්.
- ❖ මහජන ඉල්ලීම් සඳහා අවශ්‍ය කටයුතු කිරීමත්.
- ❖ සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීමත්.
- ❖ කාර්ය මණ්ඩල පෞද්ගලික ලිපිගොනු නඩත්තුව, පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීමත්.
- ❖ ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීමත්.
- ❖ සේවක වැටුප්, දීමනා, ගමන් වියදම් හා සියලුම ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාළ කටයුතුත්ය.

එසේම

- ❖ පාර්ලිමේන්තු ප්‍රශ්නවලට, මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලිවලට, මහජන පෙත්සම් කාරක සභාවේ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීම, විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.
- ❖ නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීම.
- ❖ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.
- ❖ දෙපාර්තමේන්තුවේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීම.
- ❖ නඩත්තු කටයුතු පිළිබඳව කටයුතු කිරීම.
- ❖ කැබිනට් මණ්ඩල පත්‍රිකා සැකසීම.
- ❖ පූජා භූමි කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම, පාලන අංශයට පැවරුණු වෙනත් විශේෂ රාජකාරි වේ.

03.කලාපීය භෞතික සැලසුම් අංශයේ කාර්ය සාධනය

මෙම ආයතනයේ ප්‍රධානතම කාර්යය වන ජාතික භෞතික සැලැස්ම, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ කළාපීය භෞතික සැලසුම් සකස් කිරීම මෙම අංශයට අයත් කාර්යභාරය වේ.

3.1 ජාතික භෞතික සැලැස්ම සහ ප්‍රතිපත්තිය සකස් කිරීමේ අරමුණ

රට තුළ හා ඉන් බාහිරව ඇති භෞතික සම්පත් නිසිලෙස ප්‍රයෝජනයට ගෙන ජාත්‍යන්තර වශයෙන් ඇතිවී ඇති ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලි ලෙස උපයෝගි කර ගැනීමත් භෞතික සංවර්ධන ක්‍රියාවලිය ජාතික හා ජාත්‍යන්තර ලෙස සම්බන්ධීකරණය කිරීමත් පවතින සමාජ ආර්ථික හා භෞතික විෂමතා අවම කර ගැනීමටත්, ස්වභාවික පරිසර ජාලය සහ පාරිසරික අධි සංවේදී ප්‍රදේශ රැක ගනිමින්ද , වර්ධනය කර ගනිමින්ද ස්වභාවික විපත් අවම වන අන්දමට සුදුසු ස්ථානයන්හි ජනාවාස නගර හා අපර ව්‍යුහ පහසුකම් හා වනාන්තර ඇතුළත් පාරිසරික පද්ධතියක් ස්ථාපිත කිරීමටත් ජාතික ආර්ථිකයේ ප්‍රතිලාභ දෙගුණ තෙගුණ කිරීමටත් ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම වැදගත් වේ.

3.2 ජාතික භෞතික සැලසුම සකස් කිරීමේ ක්‍රියාවලිය



රූප සටහන 02: ජාතික භෞතික සැලසුම සකස් කිරීමේ ක්‍රියාවලිය

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

3.3 කලාපීය සැලැස්ම සකස් කිරීම

- කලාපීය සැලැස්ම සකස් කරන්නේ කලාපීය සැලසුම් කමිටුව විසින්ය.
- මෙම කමිටුවේ සභාපති වන්නේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ය.
- පළාතේ සියළුම නගර සභා /ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්ද මහ නගර සභාවල නාගරික කොමසාරිස්වරුන්ද මෙම කමිටුවේ සාමාජිකයෝ වෙති.
- සමහර රජයේ ආයතනවල නිලධාරීන්ද මෙම කමිටුවට ඇතුළත් වෙති.

3.4 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විශේෂයෙන් ස්ථාපිත කර ඇත්තේ කලාපීය සැලසුම් සකස් කිරීම පිණිස පළාත් සභාවලට සහය වීමටයි. ඒ සඳහා පහත දැක්වෙන අයුරින් එම දෙපාර්තමේන්තුව පළාත් සභාවලට සහාය වේ.

- තාක්ෂණික උපදෙස් ලබාදීම
- අවශ්‍ය ඕනෑම කරුණක් පිළිබඳව කලාපීය සැලසුම් කමිටුවට අවශ්‍ය විශේෂඥයින්ගේ සේවය ලබා දීම.
- රැස්වීම් , ඉදිරිපත් කිරීම් හා මහජන අදහස් ලබා ගැනීම පිණිස සහය වීම.
- අවශ්‍ය තොරතුරු හා සැලසුම් ඕනෑම ආයතනයකින් ලබා ගැනීමට සහය වීම.
- සැලසුම්, වාර්තා ඉදිරිපත් කිරීම් සඳහා අවශ්‍ය සහය ලබාදීම.
- සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුදල්වල හිඟයක් වෙතොත් ඒවා ලබා ගැනීමට සහය වීම.



රූප සටහන 03 : කලාපීය සැලසුම් කමිටුව

3.5 කළාපීය භෞතික සැලසුම් අංශය 2012 වසරේදී කරන ලද කාර්යයන්

- උතුරු පළාත් කළාපීය භෞතික සැලැස්ම සකස් කිරීම.
    - උතුරු පළාත සඳහා කලාපීය සංවර්ධන සැලසුම සකස් කිරීම.

4. ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය

4.1 කාර්යභාරය

ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය මගින් සිදුකරනුයේ කලාපීය භෞතික සැලසුම් මගින් හඳුනාගන්නා ලද

ප්‍රාදේශීය වශයෙන් වැදගත් නගර සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ පූජා භූමි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමත් ,පූජා භූමි ගැසට් කිරීම මගින් ප්‍රකාශයට පත් කිරීමත්ය.

4.2 කුඩා නගර සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

- ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් බහුතරයකට (70%) මූලික නාගරික පහසුකම් ලභා කර දීම.
- තදාසන්න ප්‍රදේශයන්හි ආයෝජනය ග්‍රාමීය ප්‍රදේශයන්ට විතැන් කිරීම.
- අවිධිමත් නාගරීකරණයට පෙලඹෙන ජනයාට සිය ගම් බිම් ආශ්‍රිතව ක්‍රමවත් නාගරික කලාප බිහිකර දීම.
- සුපිරි මහනගරය සම්බන්ධිත සපිරි ග්‍රාම නගර පද්ධතියක් ඇති කිරීම.
- සමාජ, සංස්කෘතික, ආර්ථික, පුරාවිද්‍යාත්මක හා පාරිසරක වශයෙන් වැදගත් ග්‍රාම නගර පද්ධතියක් ජනතාවට දායාද කිරීම.
- විසල් නගරයක ඇති සියළු යටිතල පහසුකම් සහිත සපිරි ග්‍රාම පුරවර බිහිකිරීමට අවශ්‍ය පදනම යෙදීම.

4.3 ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශයේ කාර්යභාරය

- කුඩා නගර සංවර්ධන සැලසුම් සැකසීම.
- පුරනැගුම වැනි ව්‍යාපෘති හරහා ඒවා ක්‍රියාත්මක කරවීම.
- ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ සඳහා ජනාවාස සැලසුම් සැකසීම.
- ඊට අමතරව හඳුනාගත් පුජා භූමි ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම.
- සංවර්ධන සැලසුම් සැකසීම.
- අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා විවිධ ආයතන විසින් කරනු ලබන විවිධ ඉඩම් භාවිතයන් සඳහා වන නිරීක්ෂණ ලබාදීම.
- අමාත්‍යාංශය මගින් විවිධ අවස්ථාවලදී අප වෙත පවරන ලද විශේෂ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා විවිධ ආයතන විසින් කරනු ලබන විවිධ ඉඩම් භාවිතයන් සඳහා වන නිරීක්ෂණ ලබාදීම සහ අමාත්‍යාංශය මගින් විවිධ අවස්ථාවලදී අප වෙත පවරන ලද විශේෂ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම ආදිය සිදු කරයි.

4.4 2012 වසරේදී කරන ලද කාර්යයන්

1. කුරුවිට නගර මධ්‍ය සංවර්ධන සැලැස්ම
2. ජාතික භෞතික සැලැස්ම 2030, එළි දැක්වීම
3. අස්ගිරිය මහා විහාරයට වසර 700 ක් පිරීම නිමිත්තෙන් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන
4. කඳවලවත්ත සංවර්ධනය

5. උතුරු පළාත් කළාපීය භෞතික සැලැස්ම සකස් කිරීම.
6. ගනේගොඩ කතරගම දේවාලය ගැසට් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම. (1785/21-2012 නොවැම්බර් 21)
7. වල්ලහගොඩ කතරගම දේවාලයේ වලාකුළු බැම්ම සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
8. අස්ගිරිය පූජා භූමියේ වාහල්කඩ වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම

1. කුරුවිට නගර මධ්‍ය සංවර්ධන සැලැස්ම යටතේ කුරුවිට සතිපොළ විතැන් කිරීම.
2. ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදනවලින් තෙමහල් සාප්පු සංකීර්ණය (ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ) පළාත් සභාව විසින් ඉදි කරන ලදී.
3. කඳවලවත්ත
4. උතුරු පළාත් සැලැස්ම සකස් කිරීම.
5. මුලතිවු වෙරළ සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම.
6. වේගිරිය ශ්‍රී නාථ දේවාල පූජා භූමිය ගැසට් කිරීම.
7. දොළුව, ගනේගොඩ කතරගම දේවාල පූජා භූමියක් ලෙස ගැසට් කිරීම.
    - පුර නැගුම සංවර්ධන ව්‍යාපෘතිය
        - තෝරා ගන්නා ලද කුඩා නගර 54 ක් සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම.
    - ගොඩකවෙල නගර සංවර්ධන සැලසුම ක්‍රියාත්මක කිරීම.
        - පෙරහැර මාවත 2වන අදියර ආරම්භ කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම.
    - කුරුවිට නගර සංවර්ධන සැලසුම මගින හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
        - පහත ව්‍යාපෘතින් සඳහා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම.
          නගරය භූ දර්ශනය කිරීම
          මහජන චතුරශ්‍ර ඉදි කිරීම.
          මගී ගුවන් පාලම ඉදි කිරීම.
          පැරණි දුම්රිය ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම.
          සතිපොල ඉදි කිරීම.
          රථගාල ඉදි කිරීම.
          ක්‍රීඩාංගනය සංවර්ධනය හා ක්‍රීඩාගාරය ඉදි කිරීම.
        - බෙම්මුල්ල කුඩා නගර සංවර්ධන සැලසුම සකස් කිරීම.

          බෙම්මුල්ල කුඩා නගර සංවර්ධන සැලසුම සකස් කිරීම හා ව්‍යාපෘති හඳුනා ගැනීම.

        - ගනේමුල්ල කුඩා නගර සංවර්ධන සැලසුම සකස් කිරීම.

          ගනේමුල්ල කුඩා නගර සංවර්ධන සැලසුම සකස් කිරීම හා ව්‍යාපෘති හඳුනා ගැනීම.

        - කිරිඇල්ල කුඩා නගර සංවර්ධන සැලැසුම සකස් කිරීම.

          කිරිඇල්ල කුඩා නගර සංවර්ධන සැලැසුම සකස් කිරීම හා ව්‍යාපෘති හඳුනා ගැනීම.

        - පුස්සැල්ලාව නගර සංවර්ධන සැලසුම සකස් කිරීම.

          පුස්සැල්ලාව නගර සංවර්ධන සැලසුම් සකස් කිරීම.

- පූජා භූමි සැලසුම්
    - අස්ගිරිය මහා විහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය

      යෝජිත නිල ආරාමය සඳහා සැලසුම සකස් කිරීම.

      යෝජිත වාහල්කඩ සඳහා සැලසුම සකස් කිරීම.

    - කැබලියපොල පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය

      නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ පූජා භූමියක් බවට ප්‍රකාශයට පත් කිරීම.

      පූජා භූමිය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරීම

      භික්ෂු නේවාසිකාගාරය, ආවාස ගෙය ප්‍රතිසංස්කරණය කිරීම හා භූ දර්ශන කටයුතු කිරීම සඳහා සැලසුම් සකස් කිරීම.

    - සූරියගොඩ පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය

      දහම් අධ්‍යාපනය සඳහා පිරිවෙන් ශාලාව ඉදිකිරීම සඳහා සැලසුම සකස් කිරීම.

      ව්‍යාපෘතියේ කටයුතු සම්බන්ධීකරණය

    - ශ්‍රී පාදස්ථාන පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය

      ශ්‍රී පාද ප්‍රවේශ පඩි පෙළ ඉදිකිරීමේ 3 වන අදියර සඳහා සැලසුම් හා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම.

      ව්‍යාපෘතියේ කටයුතු අදාළ ආයතන සමග සම්බන්ධීකරණය

    - මහමෙව්නාව උයන සංවර්ධන ව්‍යාපෘතිය

      සැලසුම් හා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම.

      ව්‍යාපෘතියේ කටයුතු අදාළ ආයතන සමග සම්බන්ධීකරණය

    - දේවාල 32 සංවර්ධන ව්‍යාපෘතිය

      දේවාල පූජා භූමි ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම.

      සංවර්ධන සැලසුම් සකස් කිරීම.

      යෝජිත ව්‍යාපෘති සඳහා සැලසුම් සකස් කිරීම.

    - ගොම්බද්දල ශ්‍රී ශෛලතලාරාම පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය හක්මන

      පූජා භූමි සංවර්ධන සැලසුම් සකස් කිරීම, තෝරාගත් ව්‍යාපෘතීන් සඳහා ගෘහ නිර්මාණ සැලසුම් හා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම.

    - උමංගල ඔවාගිරිය රජමහ විහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය.

නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ පූජා භූමියක් බවට ප්‍රකාශයට පත් කිරීම.

පූජා භූමි සංවර්ධන සැලසුම හා භූ දර්ශන සැලසුම් සකස් කිරීම.

- මඩු කන්ද පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය

  නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ පූජා භූමියක් බවට ප්‍රකාශයට පත් කිරීම.

  පූජා භූමි සංවර්ධන සැලසුම හා භූ දර්ශන සැලසුම සකස් කිරීම.

- බටුමුල්ලකන්ද පුරාණ විහාරස්ථාන පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය

  භූ දර්ශන සැලසුම්, බෝධි ප්‍රාකාරය ඉදි කිරීම, පොදු වැසිකිලි පද්ධතිය ඉදි කිරීම සඳහා සැලසුම් සකස් කිරීම.

විශේෂිත ව්‍යාපෘති

- පර්යේෂණ - ශ්‍රී ලංකාවේ බණිජ සම්පත් පිළිබඳ පර්යේෂණය
- දැයට කිරුළ ජාතික සංවර්ධන හා අධ්‍යාපන ප්‍රදර්ශනය 2013 (අම්පාර)
- ව්‍යූහ සැලසුම් සකස් කිරීම
- අදාළ ආයතන සමඟ කටයුතු සම්බන්ධීකරණය

5.ඉංජිනේරු අංශයේ කාර්යසාධනය

5.1 කාර්යභාරය -

ජාතික සැලසුම, කලාපීය සැලසුම, ප්‍රාදේශීය සැලසුම්, කුඩා නගර, පූජා නගර, ගොඩනැගිලි, භූ දර්ශන සැලසුම ආදිය සැලසුම් කිරීමේදී හා ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය වන සිවිල් ඉංජිනේරුමය සේවාව කාර්යක්ෂමව ඉටුකර දීම.

5.2කාර්ය මණ්ඩලය -

අධ්‍යක්ෂ ඉංජිනේරු සෘජු අධීක්ෂණය යටතේ ඉංජිනේරු, පරීක්ෂක, ප්‍රමාණ සමීක්ෂණ යන අංශ තුන සේවය සපයයි. මෙම අංශයෙහි අධ්‍යක්ෂ ඉංජිනේරු යටතේ සහකාර අධ්‍යක්ෂ ඉංජිනේරුවරයෙක්, ප්‍රධාන පරීක්ෂකවරයෙකු සමග පරීක්ෂකවරු දෙදෙනෙකු, ප්‍රමාණ සමීක්ෂණ දෙදෙනෙකු, සංවර්ධන නිලධාරියකු, මැනුම් සහයකයන් දෙදෙනෙකු හා කාර්යාල කාර්ය සහයක දෙදෙනෙකු සේවයෙහි යෙදී සිටී.

5.3 දෛනික රාජකාරි

- ගොඩනැගිලි සඳහා ව්‍යුහ සැලසුම් සකස් කිරීම.
- ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශනය.
- ඇස්තමේන්තු සකස් කිරීම
- ගෙවීම් වාර්ථා හා වව්චර්පත් සැකසීම.
- ඉඩම් සමීක්ෂණ සංවර්ධන කටයුතු සඳහා පළාත් පාලන ආයතන වෙත රජයේ ඉඩම් අත්පත් කර ගැනීම පැවරීම ආදී කටයුතු සඳහා.
- නගර සැලසුම් සඳහා ඉඩම් පරිහරණ සමීක්ෂණය හා වාර්ථා සැකසීම.
- සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී අදාළ වන ලෙසට සංවර්ධන සැලසුම් සකස් හා ඉදිකිරීම් කාර්යන් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ, ඉඩම් මැනීම, සිතියම් සකස් කිරීම, සමෝච්ච රේඛා සැලසුම් සකස් කිරීම, නගර සැලසුම් ගොඩනැගිලි සැලසුම් ආදිය භූමියෙහි පිහිටුවීම.
- ඉදිකිරීම් හා භූ දර්ශන කටයුතුවලදී හා නඩත්තු කටයුතුවලදී වැඩබිම් පරිපාලනය
- ඉදිකිරීම් හා භූ දර්ශන කටයුතුවලදී වැඩ අධීක්ෂණය, බිල්පත් සැකසීම, බිල්පත් සහතිකය, රැදවුම් මුදල් නිදහස් කිරීමේ වාර්ථා, ප්‍රගති වාර්ථා ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි නඩත්තුව සඳහා ඇස්තමේන්තු සකස් කිරීම හා නඩත්තු කටයුතු ඉටු කිරීම

5.4 2012 වසරේ දී කරන ලද කාර්යයන්

අනු අංකය	ව්‍යාපෘතිය	කරන ලද කාර්යයන්
120(1)	අස්ගිරිය විහාරස්ථානය	ප්‍රධාන ප්‍රවේශ මාර්ගයේ සංවර්ධන කටයුතු. පිළිබඳ සාකච්ඡා වැඩසටහනට සහභාගි වීම. (ප්‍රවේශ මාර්ග පුළුල් කිරීම සඳහා අවශ්‍ය ඉඩ ලබා ගැනීම , ත්‍රිත්ව විද්‍යාලයේ ප්‍රේක්ෂකාගාර භූමියෙන් ඉඩම් පවරා ගැනීම හා එහිදී ඉවත් කල යුතු මායිම් තාප්පය නැවත ඉදි කිරීම.
122(2)	හක්මන	කැබිලියපොල පුරාණ රජමහ විහාරය නව සංඝාවාස ගොඩනැගිල්ල පිහිටුවීමට භූමිය පරීක්ෂා කිරීම සහ ව්‍යුහ නිර්මාණ සැලසුම් ඇඳීම
133(3)	අස්ගිරිය	මහානායක නිල නිවස ඉදිකිරිමට අවශ්‍ය ඉඩම් පිලිබඳ සොයා බැලීම.
136(4)	සිතුල් පව්ව	කාණු පද්ධතිය ක්‍රමවත් කිරීම.
137 (5)	රත්නපුර	සමන් දේවාලය රථගාල වැඩි දියුණු කිරීම
142 (6)	මහියංගනය	මහියංගනය පැරණි සංචාරක නිවාසයේ අළුත්වැඩියා කටයුතු කිරීම
145 (7)	අස්ගිරිය	ඉදිකිරීම් කටයුතු පිළිබඳ රැස්වීම පැවැත්වීම
143 (8)	හක්මන කැබිලියපොල	මාර්ගය ඉදිකිරීම සඳහා මිණුම් කටයුතු
146 (9)	මොනරාගල - මැදගම	ප්‍රාදේශිය සභා පුස්ථකාල ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු පරීක්ෂා කිරීම.
	අම්පාර	අරන්තලාව වාහල්කඩ සඳහා පස් පරීක්ෂා කිරීම සහ වාහල්කඩ ව්‍යුහ නිර්මාණ කටයුතු සැලසුම් පිළියෙල කිරීම සහ ඇස්තමේන්තු සකස් කිරීම
11	මුල්ගිරිගල	සංවර්ධන කටයුතු සඳහා පරීක්ෂා කිරීම් පලමු මළුව, අරමුදල් කාර්යාලය, දෙවැනි මළුව විහාර ගෙය, තුන්වැනි මළුව වම්පස විහාරගෙය , පඩිපෙල උඩ මළුව දෙමහල් ගොඩනැගිල්ලක් සඳහා ව්‍යුහ නිර්මාණ කටයුතු සැලසුම කර ඇස්තමේන්තුව පිළියෙල කිරීම
	නයිගල රජමහ විහාරය	මායිම් තාප්ප, ප්‍රවේශ මාර්ගය , වලාකුළු බැම්ම,
	තිස්සමහාරාමය	කාර්යාල ගොඩනැගිල්ලේ වහළ

147(12)	අස්ගිරිය රජමහ විහාරය	නව ප්‍රවේශ මාර්ගයේ කොටසක් ගිලා බැසීම පිළිබඳ පර්යේෂණ කටයුතු
148(13)	අනුරාධපුර	ලෝලුගස්වැව නැවත පදිංචිකිරීම කටයුතු සඳහා යෝජිත

5.5 2012 **වසරේ දී** ප්‍රමාණ සමීක්ෂණ අංශය **කරන ලද කාර්යයන්**

1. කතරගම සංචාරක බංගලාවේ ප්‍රවේශ මාර්ගයට ගල් ඇතිරීම
2. අපද්‍රව්‍ය ටැංකිය ඉදිකිරීම
3. අස්ගිරිය රජමහ විහාරය මායිම් තාප්පය , පස් රැදවුම් බැම්ම , ගේට්ටුව.
4. අස්ගිරිය රජමහ විහාරය මායිම් තාප්පය
5. හක්මන කැබලියපොල රජමහ විහාරය සංඝාවාස ගොඩනැගිල්ල
6. ගොන්බද්දර සීල මාතාරාමය වාහල්කඩ පස් රැදවුම් බැම්ම.
7. අළුත් නුවර පූජා භූමි සංවර්ධන
8. අම්පාර අරන්තලාව බෞද්ධ මධ්‍යස්ථානය වාහල්කඩ
9. සේරුවාවිල පූජා භූමි සංවර්ධන සංචාරක බංගලාව අළුත්වැඩියාව
10. දැයට කිරුළ 2013 තාවකාලික වැසිකිලි අම්පාර
11. අපද්‍රව්‍ය ටැංකිය
12. මහියංගනය පූජා භූමි සංවර්ධන භූ දර්ශන කටයුතු
13. අස්ගිරි මහා විහාරය මහානායක නිල ආරාමය
14. කොම්බිච්චම්කුලම සංවර්ධන යෝජනා ක්‍රමය
15. කතරගම සංචාරක බංගලාවේ ප්‍රවේශ මාර්ගයට ගල් ඇතිරීම
16. අපද්‍රව්‍ය ටැංකිය ඉදිකිරීම
17. අස්ගිරිය රජමහා විහාරය මායිම් තාප්පය , පස් රැදවුම් බැම්ම , ගේට්ටුව.
18. අස්ගිරිය රජමහා විහාරය මායිම් තාප්පය
19. හක්මන කැබලියපොල රජමහා විහාරය සංඝාවාස ගොඩනැගිල්ල
20. ගොම්බද්දර සීල මාතාරාමය වාහල්කඩ පස් රැදවුම් බැම්ම.
21. අළුත් නුවර පූජා භූමි සංවර්ධන
22. අම්පාර අරන්තලාව බෞද්ධ මධ්‍යස්ථානය වාහල්කඩ
23. සේරුවාවිල පූජා භූමිසංවර්ධන සංචාරක බංගලාව අළුත්වැඩියාව
24. දැයට කිරුළ 2013 තාවකාලික වැසිකිලි අම්පාර
25. අපද්‍රව්‍ය ටැංකිය
26. මහියංගනය පූජා භූමි සංවර්ධන භූ දර්ශන කටයුතු
27. අස්ගිරි මහා විහාරය මහානායක නිල ආරාමය
28. කොම්බිච්චම්කුලම සංවර්ධන යෝජනා ක්‍රමය

06.වාස්තු විද්‍යා අංශය

වාස්තු විද්‍යා අංශය අධ්‍යක්ෂ වාස්තු විද්‍යා යටතේ පවතී. මෙම අංශය සැලසුම් කාර්යාල සහකාරවරුන්, සැලසුම් ශිල්පීන් 21 දෙනෙකුගෙන් සමන්විත වේ. එක් සැලසුම් කාර්යාල සහකාරවරයකු හා සැලසුම් ශිල්පීන් කිහිප දෙනෙකු අවශ්‍යතාවය අනුව අධ්‍යක්ෂ (ඉංජිනේරු) යටතේ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ඉංජිනේරු අංශයට අනුයුක්තව කටයුතු කරනු ලැබේ.

ගෘහ නිර්මාණ ශිල්පීන්, ඉංජිනේරුවරුන් නගර නිර්මාණකරුවන් විසින් සකස් කරන ලද සැලසුම් අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) මගින් සැලසුම් සහකාරවරුන්ට ලැබී වාස්තු විද්‍යා සැලසුම්, ඉංජිනේරු සැලසුම් හා වින්‍යාස සැලසුම් සකස් කිරීම සිදු කෙරේ.

මෙම සකස් කරන සැලසුම් ගබඩා කිරීම, පිටපත් කිරීම හා විනාශ නොවී පවත්වාගෙන යාම සඳහා සැලසුම් භාරකරුවකු, සැලසුම් මුද්‍රණ ශිල්පීන් දෙදෙනෙකු හා සැලසුම් අළුත්වැඩියා කරන්නකු මෙම අංශය යටතේ තවදුරටත් සේවයේ නියුක්ත වේ.

6.1 2012 වසරේ දී නිම කරන ලද වින්‍යාස සැලසුම්

අනු අංකය	පූජා භූමිය	ව්‍යාපෘතිය
A/ST/203/12	දැයට කිරුළ - 2012	Septic tank සහ soakage pits සඳහා සැලසුම් ඇඳීම
A/AR/204/12	අස්ගිරිය විහාරය	යෝජිත වාහල්කඩ සැලසුම් කිරීම
A/ST/205/12	අනුරාධපුරය	බෞද්ධ මධ්‍යස්ථානයේ විශ්‍රාම ශාලාව සඳහා ව්‍යුහාත්මක සැලසුම් ඇඳීම.
A/AR/207	අස්ගිරිය	යෝජිත ලාම්පු කණු සැලසුම් කිරීම
A/ST/208/12	අස්ගිරිය	පදික වේදිකාව සහ වැසි ජල කැණුව සැලසුම් කිරීම
A/AR/209/12	අස්ගිරිය	යෝජිත පන්සල් පාර සැලසුම් කිරීම
A/AR/210/12	අස්ගිරිය	යෝජිත පන්සල් පාර සැලසුම් කිරීම
A/AR/211/12	අස්ගිරිය	නාම පුවරුව සකස් කිරීම
A/AR/212/12	අස්ගිරිය	ලාම්පු කණු සඳහා ව්‍යුහ සැලසුම් සකස් කිරීම
A/AR/213/12	අළුත්නුවර දේවාලය	ආරක්ෂක බැම්ම සැලසුම් කිරීම
A/AR/214/12	අළුත්නුවර දේවාලය	Plague
A/AR/215/12	අළුත්නුවර දේවාලය	වාහල්කඩ plague
A/AR/216/12	ශ්‍රී මහා බෝධිය	වාහල්කඩ සැලසුම් කිරීම
A/AR/217/12	අස්ගිරිය	මාර්ගය සැලසුම් කිරීම (පදික වේදිකාව)
A/AR/219/12	අස්ගිරිය	සීමා බැම්ම සැලසුම් කිරීම
A/AR/220/12	අස්ගිරිය	යෝජිත වාහල්කඩ - 2
A/ST/222/12	අස්ගිරිය	නාම පුවරුවේ පදනම සඳහා සැලසුම් සකස් කිරීම

A/AR/223/12	අළුත්නුවර	යෝජිත පොලිස් මුරපොල සැලසුම් කිරීම
A/AR/224/12	අම්පාර පුළුකුනාව රජමහා විහාරය	යෝජිත විශ්‍රාම ශාලාව සඳහා සැලැස්ම සකස් කිරීම
A/ST/225/12	අස්ගිරිය	බෞද්ධ පාසල පදනම සැලසුම් කිරීම
A/ST/226/12	අස්ගිරිය	පඩිපෙළ ප්‍රතිසංස්කරණය සඳහා සැලැස්මක් පිළියෙල කිරීම
A/AR/227/12	අස්ගිරිය	ප්‍රධාන දොරටුව සැලසුම් කිරීම
A/AR/228/12	අස්ගිරිය	බුදු කුටිය අසල දොරටුව සැලසුම් කිරීම
A/AR/229/12	අස්ගිරිය	යෝජිත දොරටුව සැලසුම් කිරීම -මුල්ලේගම විහාරස්ථානය
A/ST/230/12	අළුත්නුවර දැඩිමුණ්ඩ දේවාලය	පොලිස් මුරපොළ සැලසුම් කිරීම
A/ST/231/12	අළුත්නුවර දැඩිමුණ්ඩ දේවාලය	පුවරු තලාදය (Slab beam) පිළිබඳ සැලැස්ම
A/AR/233/12	අස්ගිරිය චන්දානන්ද විද්‍යාලය	දොර ජනෙල් පිළිබඳ සැලැස්ම
A/AR/234/12	අස්ගිරිය විහාරය	යෝජිත වාහල්කඩ
A/ST/235/12	අම්පාර අරන්තලාව බෞද්ධ මධ්‍යස්ථානය	යෝජිත වාහල්කඩ සඳහා පදනම පුවරු තලාදය (Slab beam) පිළිබඳ ව්‍යුහගත සැලැස්ම
A/AR/238/12	දැයට කිරුළ - 2013	ජීම් එක සහ පේක්ෂකාගාරය සඳහා සැලැස්ම
A/AR/239/12	අස්ගිරිය	යෝජිත නීල ආරාමය සඳහා සැලැස්ම
B/ST/70/12	බදුල්ල කතරගම දේවාලය	ලාම්පු කණු සඳහා පදනම සැලසුම් කිරීම
B/AT/71/12	බොරැල්ල ගෝතමී විහාරය	බහු කාර්ය ගොඩනැගිල්ල සැලසුම් කිරීම
B/AR/72/12	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	පඩි පෙළ සැලසුම් කිරීම
G/AR/33/12	ගොනාබොඩ ශීලාරාමය	විදුලි ලාම්පු කණු සහ වාහල්කඩ සැලසුම් කිරීම
H/PL/28/12	හක්මන කැබිලියපොල පුරාණ විහාරය	විනිශ්චය සැලැස්ම
H/PL/29/12	හක්මන කැබිලියපොල පුරාණ විහාරය	නවාතැන් පහසුකම් සඳහා ගොඩනැගිල්ල සැලසුම් කිරීම
H/PL/30/12	හක්මන කැබිලියපොල පුරාණ විහාරය	නවාතැන් පහසුකම් සඳහා ගොඩනැගිල්ල සැලසුම් කිරීම
H/PL/31/12	හක්මන කැබිලියපොල පුරාණ විහාරය	
H/PL/32/12	හක්මන කැබිලියපොල පුරාණ විහාරය	වහළ සැලැස්ම ඇඳීම
H/PL/33/12	හක්මන කැබිලියපොල	දැනට පවතින දාගැබ සඳහා සැලැස්ම ඇඳීම

	පුරාණ විභාරය	
H/PL/34/12	හක්මන කැබිලියපොල පුරාණ විභාරය	දැනට පවතින විභාරගේ සැලැස්ම ඇඳීම
A/AR/35/2012	හෙට්ටිපොල පුර නැගුම ව්‍යාපෘතිය	ආර්ථික මධ්‍යස්ථානය සඳහා සැලැස්ම
A/AR/36/2012	හෙට්ටිපොල පුර නැගුම ව්‍යාපෘතිය	බස් නැවතුම්පොළ සඳහා සැලැස්ම
A/AR/37/2012	හෙට්ටිපොල පුර නැගුම ව්‍යාපෘතිය	පොලිස් මුරපොළ සඳහා සැලැස්ම
A/AR/38/2012	හෙට්ටිපොල පුර නැගුම ව්‍යාපෘතිය	වැසිකිළි පද්ධති සඳහා සැලැස්ම
A/AR/39/2012	හෙට්ටිපොල පුර නැගුම ව්‍යාපෘතිය	නවාතැන් පහසුකම් සඳහා සැලැස්ම
A/AR/40/2012	හෙට්ටිපොල පුර නැගුම ව්‍යාපෘතිය	ආදාහනාගාරය සඳහා සැලැස්ම

07.ගිණුම් අංශයේ කාර්යසාධනය

7.1 ගිණුම් අංශයේ අරමුණු

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ, මූල්‍ය රෙගුලාසි ආයතන සංග්‍රහය අනෙකුත් චක්‍රලේඛ නීතිරීතිවලට පටහැනි නොවන සේ ඵලදායීව හා කාර්යක්ෂමව මූල්‍ය කළමනාකරණය සිදු කිරීම.

7.2 සේවාවන්

1. දෙපාර්තමේන්තුවේ හා ව්‍යාපෘතිවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට වැටුප් හා වේතන, අනෙකුත් අදාල වියදම් ගෙවීම.
2. සිදු කරනු ලබන මූල්‍යමය ගණුදෙනු වලට අදාල මාසික ගිණුම් සාරාංශ සකස් කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.
3. වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම.
4. දෙපාර්තමේන්තුවට හා ඒ යටතේ ඇති ආයතනවලට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම හා ගබඩා කටයුතු පවත්වාගෙන යාම.
5. වත්කම් කළමනාකරණය.
6. විගණකාධිපති වෙත විගණනය සඳහා ලිපි ලේඛන ඉදිරිපත් කිරීම හා විගණන විමසුම්වලට පිළිතුරු ඉදිරිපත් කිරීම.
7. අත්තිකාරම් බී ගිණුම යටතේ ණය ගෙවීම හා අයකර ගැනීම.

2012 විසර්ජන ගිණුම

වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහන් අංකය		(1)	(2)	(3)	(4)	(5)	(6)	
	වාර්ෂික ඇස්ත මේන්තු වෙහි සඳහන් වැඩසට හනෙහි නම	අය වැය ඇස්තමේන්තු වෙන් කිරීම	පරිපූරක ප්‍රතිපාදන හා පර්පූරක ඇස්තමේ න්තු වෙන් කිරීම	මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් (+/-)	මුළු ශුද්ධ වෙන් කිරීම් (1-2)+3+4	මුළු වියදම	ශුද්ධ ප්‍රතිඵලය (ඉතිරිය /අතිරික් තය)	
		රු	රු	රු	රු	රු	රු	
xx01 xx xx xx	මෙහෙයුම් වැඩසට හන්	144,135,000	400,000	-200,000	144,335,000	139,359,552	4,975,448	2

	උප එකතුව (පුනරාවර්තන)	144,135,000	400,000	-200,000	144,,335,540	139,359,552	4,975,448	
xx01 xx	<u>මූලධන</u> මෙහෙයුම් වැඩසටහන්	1,175,000		100,000	3,300,000	1,200,255	1,849,745	2
xx02	සංවර්ධන වැඩසටහන්		200,000	100,000	7,200,000	18,823,945	1,176,055	3
	උප එකතුව (මූලධන)	1,175,000	400,000		10,500,000	20,024,200	3,025,800	
	පුනාරාවර්තන එකතුව	144,135,000	810,540	7,600,000 - 7,600,000	138,660,540	133,797,006	2,342,994	
	මූලධන එකතුව	1,175,000	400000	100,000 -100,000	10,500,000	20,024,200	3,025,800	
		145,310,000	1,210,540	0	149,160,540	153,821,206	5,368,794	

1. පුද්ගලික පඩිනඩි හා සම්බන්ධ ප්‍රතිපාදන මත දරන ලද වියදම - 2012

	2012 ඇස්තමේන්තු (රු)	මු.රෙ.66/69 මාරු කිරීම් (රු)	පරිපූරක ඇස්තමේන්තු (රු)	මුළු ප්‍රතිපාදන ᵖ(රු)	මුළු වියදම (රු)
පුද්ගලික පඩිනඩි	100,986,900 101,700,000	(600,000) 10,000,000) 10,113,100)	-	100,986,900	98,794,005

2 .අනෙකුත් පුනරාවර්තන වියදම් හා සම්බන්ධ ප්‍රතිපාදන මත දරන ලද වියදම - 2012

	2015 ඇස්තමේන්තු (රු)	මු.රෙ.66/69 මාරු කිරීම් (රු)	පරිපූරක ඇස්තමේන්තු (රු)	මුළු ප්‍රතිපාදන ᵖ(රු)	මුළු වියදම (රු)
අනෙකුත් පුනරාවර්තන වියදම්	42,435,000	833,100 (320,000)	400,000	43,348,100	40,565,547

3 . 2012 වර්ෂයේ ආදායම් වාර්තාව

විස්තරය	මූලික ඇස්තමේන්තුව (රු.මි)	සංශෝධිත ඇස්තමේන්තුව (රු.මි)	ආදායම 2012 (රු.මි)
2002-10-01	2.4	1.5	1.95
2002-20-02	1.5	1.5	1.54
2003-99-00	1.5	1	1.28